# දැන්වීමයි

## ශිෂ්‍ය නේවාසිකාගාර වල නේවාසිකව සිටින කළමනාකරණ හා මූල්‍ය පීඨයේ ප්‍රථම වසර සහ දෙවන වසර (2022/2023 සහ 2021/2022 ප්‍රවේශ වර්ෂය) ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා.

මැද්දවත්ත පිරිමි නේවාසිකාගාරය, එළියකන්ද පිරිමි නේවාසිකාගාරය, වැල්ලමඩම අංක 02 සහ අංක 03 කාන්තා නේවාසිකාගාරය, එළියකන්ද නව සහ පැරණි කාන්තා නේවාසිකාගාරයන්හි දැනට නේවාසිකව සිටින කළමනාකරණ හා මූල්‍ය පීඨයේ ප්‍රථම වසර (2022/2023 ප්‍රවේශ වර්ෂය) සහ දෙවන වසර (2021/2022 ප්‍රවේශ වර්ෂය) අධ්‍යයන කටයුතු හදාරන ශිෂ්‍ය කණ්ඩායමට අයත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ 2023/2024 අධ්‍යයන වර්ෂයේ පළමු සමාසික පරීක්ෂණ 2024.09.19 දිනෙන් අවසන් වීමට නියමිතව ඇත.

ඒ අනුව එම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ 2024.09.20 දින සිට නිවාඩු කාලය (Vacation) ආරම්භ වන බැවින් අදාළ නේවාසිකාගාර වලින් 2024.09.20 දින මධ්‍යාහ්න 12.00 ට පෙර තාවකාලිකව ඉවත් විය යුතුවේ. නැවත පීඨයේ දෙවන සමාසිකයේ අධ්‍යයන කටයුතු ආරම්භ කරන දිනට පෙර දින අදාළ නේවාසිකාගාරයට පැමිණිය හැකි බව මෙයින් දන්වා සිටිමි.

සහකාර ලේඛකාධිකාරි
ශිෂ්‍ය කටයුතු අංශය
2024.09.19

පිටපත - නියෝජ්‍ය උපකුලපති
පීඨාධිපති/කළමනාකරණ හා මූල්‍ය පීඨය
ශාලාධිපති
නියෝජ්‍ය ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක/කළමනාකරණ හා මූල්‍ය පීඨය
උපශාලාධිපති/එළියකන්ද පිරිමි නේවාසිකාගාරය, මැද්දවත්ත පිරිමි නේවාසිකාගාර
උපශාලාධිපතිනි/වැල්ලමඩම අංක 02 සහ 03 කාන්තා නේවාසිකාගාරය,
එළියකන්ද නව සහ පැරණි කාන්තා නේවාසිකාගාරය